# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

## බාහිර උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි කිරීම - 2021

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව**

**අ). කොටස - ලියාපදිංචිට තෝරා ගැනීම සඳහා අයදුම් කිරීමේ සුදුසුකම්**

1. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේතුව විසින් 2000 වසරේ හෝ ඉන්පසු පවත්වන ලද අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ පරීක්ෂණයෙන් ප්‍රධාන විෂයන් තුනම එකර සමත් වී තිබීම

හෝ

2000 වර්ෂයට පෙර අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයට පෙනී සිට ඇත්නම් විෂයයන් හතරම එකවර සමත් වී තිබීම

හෝ

2. ශ්‍රී ජයවර්ධනපුර විශ්විද්‍යාලයේ සනාතන සභාව විසින් පිළිගත් මතු දැක්වෙන වෘත්තිය හා වෙනත් සුදුසුකම්

   I. පිළිගත් විශ්වවිද්‍යාලයකින් ආයතනයකින් උපාධියක් ලබා තිබීම
   II. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ හෝ ශ්‍රී ලංකාවේ පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් පිරිනමනු ලබන වසරකට නොඅඩු ඩිප්ලෝමා පරීක්ෂණයකින් සමත් වීම (SLQF level 3 / NVQ Level 5)
   III. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පුහුණු ගුරු සහතිකය ලබා තිබීම
   IV. ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ අවසාන නීති පරීක්ෂයෙන් සමත් වීම

2021 ජනවාරි 15 දිනැති අංක 01/2021 දරණ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයට අනුව විෂයයන් තෝරා ගැනීමේ ක්‍රමවේදය සංශෝධනය කර ඇති අතර එකී සංශෝධනයන්ට අනුකූලව ඔබ විසින් විෂයයන් තෝරා ගත යුතු වේ.

ඒ අනුව මෙම උපාධි පාඨමාලාවට අදාළ සියලුම විෂයයන් විෂය කාණ්ඩ 03 කට වර්ගීකරණය කර ඇත. එම විෂය කාණ්ඩ පහත දැක්වේ.

**01 කාණ්ඩය**
**එක් විෂයක් පමණි**

- සිංහල
- සමාජ විද්‍යාව
- දේශපාලන විද්‍යාව
- මනෝවිද්‍යාව
- සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
- ඉතිහාසය

**02 කාණ්ඩය**
**විෂයයන් එකක් හෝ දෙකක් පමණි**

- සමාජ සංඛ්‍යානය
- ආර්ථික විද්‍යාව
- ඉංග්‍රීසි
- පුරාවිද්‍යාව
- භූගෝල විද්‍යාව
- ජාත්‍යන්තර සම්බන්ධතා
- පාලි
- අපරාධ විද්‍යාව

**03 කාණ්ඩය**
**එක් විෂයක් පමණි**

- මානව විද්‍යාව
- සංස්කෘත
- බෞද්ධ දර්ශනය
- සංස්කෘතික හා සෞන්දර්ය අධ්‍යයනය
- සංගීතය
- නාට්‍ය රංගකලාව
- නර්තනය
- දර්ශනය
- හින්දි
- බෞද්ධ ශිෂ්ඨාචාරය

එබැවින් මෙම උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා විෂයයන් තෝරා ගත හැකි ක්‍රමවේදය වන්නේ,

**ක්‍රමවේදය 01 - : පහත සඳහන් විෂය කාණ්ඩ 03 න් එක් විෂය බැගින් විෂයයන් 03 ක් තෝරා ගැනීම.**

මේ යටතේ අයදුම්පත සම්පූර්ණ කරන්නේ නම් වෙබ් අඩවියෙහි පළකොට ඇති අයදුම්පතෙහි පළමු විෂය කාණ්ඩයට 1 ද දෙවන විෂය කාණ්ඩයට 1 ද තෙවන විෂය කාණ්ඩයට 1 ද යෙදිය යුතුය. ඉන්පසු **කාණ්ඩ 03හි සියළුම විෂයයන්** සඳහා තමාගේ මනාපය අනුපිළිවෙළින් ඒ ඒ විෂය කාණ්ඩය සඳහා ඉදිරිපත් කළ යුතුය.

**ක්‍රමවේදය 02 - : 01 වන විෂය කාණ්ඩයෙන් එක් විෂයයක් හා 02 වන විෂය කාණ්ඩයෙන් විෂයයන් 02 ක් තෝරා ගැනීම.**

මේ යටතේ අයදුම්පත සම්පූර්ණ කරන්නේ නම් වෙබ් අඩවියෙහි පළකොට ඇති අයදුම්පතෙහි පළමු විෂය කාණ්ඩයට 1 ද දෙවන විෂය කණ්ඩයට 2 ද තෙවන විෂය කාණ්ඩය සඳහා 0 ද යෙදිය යුතුය. ඉන්පසු **කාණ්ඩ 03හි සියළුම විෂයයන්** සඳහා තමාගේ මනාපය අනුපිළිවෙළින් ඒ ඒ විෂය කාණ්ඩය සඳහා ඉදිරිපත් කළ යුතුය.

විෂයයන් තෝරා ගැනීමෙන් අනතුරුව **www.external.sjp.ac.lk/reg** යන අපගේ වෙබ් අඩවියෙහි පළ කර ඇති අයදුම්පත සම්පූර්ණ කර මාර්ගගත ක්‍රමවේද ඔස්සේ යොමු කළ **(Submit)** යුතුය.

සම්පූර්ණ කරන ලද ඔබගේ තොරතුරු පත්‍රිකාව නියෝජ්‍ය ලේඛකාධිකාරී, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ යන ලිපිනයට ලියාපදිංචි තැපැල මගින් ඉදිරිපත් කළ යුතුය.

යම් විෂයයක් සඳහා බඳවා ගැනීමට අපේක්ෂිත ශිෂ්‍ය සංඛ්‍යාව ඉක්මවා යන විට ඔබේ මනාපයේ අනුපිළිවෙළ අනුව විෂයයන් සඳහා අනුයුක්ත කිරීම සිදු කරනු ලබයි.

<u>සැළකිය යුතුයි ඃ-</u>

I. නර්තනය හා සංගීතය විෂයන් සඳහා සිසුන් තෝරා ගැනීමට ප්‍රායෝගික පරීක්ෂණයක් පවත්වන අතර එම විෂයන් හැදෑරීමට පරීක්ෂණයෙන් සමත් විය යුතුය. පරීක්ෂණයෙන් අසමත් වන සිසුන් ඒ වෙනුවට වෙනත් විෂයයක් තෝරා ගත යුතුය.

II. ඉංග්‍රීසි භාෂාව විෂයයක් ලෙස හැදෑරීම සඳහා ද පරීක්ෂණයක් පවත්වන අතර ඔබ එම පරීක්ෂණයෙන් සමත් විය යුතුය. (අ.පො.ස (උ/පෙළ) පරීක්ෂණය සඳහා ප්‍රධාන විෂයයක් ලෙස ඉංග්‍රීසි විෂයය හදාරා අවම වශයෙන් 'S' සාමාර්ථයන් ලබා තිබේ නම් පරීක්ෂණයට පෙනී සිටීම අවශ්‍ය නොවේ.)

III. සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය හැදෑරීමට අ.පො.ස (උ/පෙළ) පරීක්ෂණය සඳහා ජනසන්නිවේදනය විෂයය හදාරා තිබිය යුතුය.

IV. **ඔබ විසින් තෝරා ගන්නා ලද විෂයයන් නැවත සංශෝධනය කිරීමට අවස්ථාවක් නොමැත.**

නියෝජ්‍ය ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
2021.05.20